# ලෝකාන්තය

| | |
|---|---|
| බාධක මැඩ ලැබූ දිවි ජය | නංවන්න |
| දිවියෙහි අගදි වන පාළුව | දුරලන්න |
| ඉමිහිරි අතීතයෙ රසමුසු | සිහිවන්න |
| තැබූ සටහන කුසුම් ඔබටයි | පිළිගන්න |

ජයසිරි විජේරත්න

පාකිස්ථානයේ හයිද්‍රබාද්හි
සිවිලි ගුවන් සේවා ආයතනයේදීය
1991 අගෝස්තු 25.

පරිගනකගත **කළේ** 2011 මාර්තු 3

## චාරිකාව

සරසවි දිවියේ අවසාන වසරේ මුල්වාරය තුල, කලා අංශයේ ශිෂ්‍ය සංගමයක් වන ගාන්ධර්ව සභාව මගින් ලොකාන්ත චාරිකාවක් සංවිධානය කරඇති බව ඊට පෙරදින මට දැනගන්නට ලැබුනි. පළමු වසරේ සිට විජේවර්ධන ශාලාවේ විසූ මිතුරන් වන වි.මු.පොඩිබන්ඩා සහ ආර්.ඒ විජේරත්න, මා හමුවී "වරෙන් බං යන්න අවුරුදු දෙකක් වේලි වේලි හිටිය මදෑ කෙල්ලෙක්වත් සෙට් කරල දෙන්නම්" යයි කීය. ආර්.ඒ.විජේරත්නගේ කීම අනුමත කළ පොඩිබන්ඩා "අර කෙට්ටු කෙල්ල කුසුම් නම් විජෙයට ගැලපෙනව නේද?" යයි කීවේය. විනෝද චාරිකාවලට මගේ එතරම් ඇල්මක් නොතිබුනෙන්ද, ඔවුන්ගේ විහිළු තහළු කවදත් ඇසෙන සුපුරුදු කතා නිසාද, මා එතරම් ගනන් ගත්තේ නැත. පසුව කතාවට හවුල්වූ පළමු වසරේ රූමාවන (room mate) ගුණසේකරද ඇවිටිලි කළ නිසා, පසුදා ගමණට සූදානම් වූයෙමි.

## පාවහන් ගැණීම

එදින (1967 නොවැ. 9) අප රැගත් බස්රිය උදේ සරසවි භූමියෙන් පිටත්විය. මා සිටියේ බස්රියේ පිටුපසට වන්නය. වැඩිදෙනෙක් ගීගයමින් විනෝදවෙමින් යන අතර බසයේ ඉදිරිපස හිටගෙන සිටි ඇගේ මුහුණ හදිසියේම මට පෙනුනේ පුංචිඅක්ක වගේමය. නිල් සහ සුදු ඉරිවැටුන පිනකෝ ගවුමකින් සැරසී සිටි ඇය පුංචිඅක්කාට වඩා තරමක් කෙට්ටු වුවත්, මුහුණුවර පැත්තෙන් පෙනෙනවිට කිසිම වෙනසක් නැතිව පෙනුන බැවින් සුළු මොහොතක් බලා සිටියෙමි. හදිසියේම නෙතට නෙත ගැටුන නමුත් එය මොහොතකට සීමාවිය. අඩු වශයෙන් සිනහ පොදක්වත් නොරැඳුනි. තව ගැහැණු ළමයි කොතෙකුත් සිටියත් මගේ නෙත ගැටුනේ ඈ වෙත පමණි. එයද සාංසාරික හමුවක් යයි දැන් මට හැඟී යයි.

පසුව ගම්පොල නගරයේ බසය නතරකළ බැවින් ගුණසේකර හා මා පාරේ එහාමෙහා ඇවිද නැවත බස්රිය වෙතට ආවෙමු. බසයට ගොඩවන විටම ඇය මා අමතා "තියෙනවද" යයි විමසීය. මා පුදුමයෙන් මෙන් "මොනවද?" යයි ප්‍රශ්ණයකින්ම පිළිතුරු දුනිමි. "ඇයි සපත්තු කඩයක්.... ආ මං හිතුවෙ ඔයගොල්ලො සපත්තු කඩයක් බලන්න ගියා කියලයි....අනේ මගෙ සෙරෙප්පුව කැඩුනනෙ." "ආ ඇත්තද, ගුණේ අපි ගිහින් බලමුද එහෙනම්" කියා ගුණසේකර සමග ගොස් සපත්තු කඩයක් තියත තැන සොයාගෙන ආවෙමු. පසුව අප දෙදෙනාම ඈ සමග ගොස් සෙරෙප්පු කුට්ටමක් මිළට ගත් පසු ආපසු බස්රිය වෙත පැමිණි නමුත් ඊට වඩා යමක් කථාකිරීමට උනන්දුවක් නොතිබුනත් එම සිදුවීම පවා සංසාරික හමුවක් යයි දැන් මට සිතේ.

## පළමු බත්පත

මධ්‍යාහ්නය පසුවනවිට මිනිස් වාසයෙන් ඈත, ලෝකාන්තයට පිවිසෙන මගට ළඟාවිය. මහමග ඉන් අවසන්වේ. ඉන් එහාට රථවාහන යාම අසීරුය. හැමෝම බස්රියෙන් බැස සිසිල් සුන්දර වනපියසෙන් හෙබි පරිසරය නරඹමින් ගිමන් හරින අතර, සංවිධායකයින් දිවා ආහාර පාර්සල් සහිත පෙට්ටියද රැගෙන, ආහාර ගැණීමට සුදුසු තැනක් සෙවීමේ නිරතවිය. හොඳින් තණකොළ වැවී ඇති තැනිතලා තුරු සෙවනෙහි තැබූ පෙට්ටියෙන් පාර්සල් එක එක රැගෙන කවුරුකවුරුත් බිම වාඩිවී ආහාර ගැණීම ආරම්භවිය. මා සාමාන්‍යයෙන් පෝලිම් වල සිටීමට අකමැතිය. එබැවින් අවට කැලෑවේ සිරි නරඹමින් සිට, සුපුරුදු ලෙස කලබලකාරයින්ට ඉඩ දී පෝලිමේ අන්තිමටම එක්වී, මගේ වාරය පැමිණිවිට, මා දෙස බැලූ ඈ "භානේ ඔයා ගත්තෙ නැද්ද?, මේ අන්තිම එකනෙ මං ගත්තෙ,..... එන්න මේකෙන් බාගයක් ඔයා ගන්න" යයි කීවාය. මා මොහොතකට ගොළුවිය. වෙන නැද්ද කියල අහන්නත් බෑ,...මේ ළමය දෙන්න හදනකොට එපා කියන්නත් බෑ,.....බෙදාගෙන කන්න පිහන් ඇත්තෙත් නෑ,...ගැණුළමයෙක් එක්ක එක බත්පත

කන්නත් ලැජ්ජයි,....අඳුනන්නෙත් නෑ,....දැක්කෙත් අදමයි,...මා එක මොහොතකට ප්‍රශ්ණ ජාලයකට මැදිවිය. " කමක් නෑ හිත හොඳින් කතාකළ එකනෙ" යයි සිතූ මා ඈ අසලින්ම වාඩිවුනෙමි. එසේ ආහාර ගන්නා අතර "අන්න බං අරුං දෙන්න එක බත්එක කනව" ......"අනේ අනේ අපිටත් හොරෙන්ම සැට්වෙලා නේද?" ...... "ඕකෙ නම් පුතෝ හොරෙයක් තියනව"......"මං කිව්වෙ නැද්ද විජේට කුසුම් තමයි ගැලපෙන්නේ කියල"......යනාදී නොයෙක් කතා වටින් පිටින් ඇසෙන්නටවිය. ඊයෙ රෑ පොඩිබන්ඩ කිව්ව කුසුම් මෙයා නේද යයි සිතුනේ මෙවිටය. බස්රියේදි වරක් නෙතට-නෙත ගැටුනෙත් මෙයා නේද, ගම්පොලදි සපත්තු කඩයක් හෙව්වෙත් මෙයා නේද යයි සිතුනි. මේ හැම එකක්ම අහම්බෙන් සිදුවිය හැකිද, මෙතෙක් වේලා එතරම් ගණන් නොගත්තද, ඔවුන්ගේ විහිළු තහළු යටි සිතේ හොල්මන් කරන්නටවිය. පොඩිබණ්ඩා විහිළුවටමෙන් කී කතාව ඇත්ත වෙයිද යනාදී නොයෙක් සිතුවිලි මැද ආහාර ගැනීමට සිදුවිය.

අමතක නොවන ඒ බත්පත අනුභව කළ පසු මසිත නොසන්සුන් බව මටම හැඟුනි. ඇගේ යෙහෙලියන්වන ටිකිරි හා ස්වර්ණා ඈ දෙසත් මා දෙසත් හෙලූ බැල්ම මට තවමත් මැවී පෙනේ. "අපේ සුභපැතුම් මෙන්න" යයි කියන්නාක් මෙනි. අප යම් යම් දේ ගැන කතා කලද එතරම් මාතෘකා නොමැතිවිය. ඇගේ යෙහෙළියන්ව මට හඳුන්වා දුන්නත් මට හඳුන්වා දෙන්න කිසිවෙක් නැත. මගේ මිතුරන් හැමෝම ඇගේද මිතුරන් වීම ඊට හේතුව විය. (ඒ සියල්ලන්ම කලාපීඨයේ සිසුන් වූ අතර, විද්‍යා පීඨයෙන් සිටියේ මා පමණි.)

දිවා භෝජනයෙන් පසු සියල්ලෝම පා ගමන් ඇරඹූ අතර අප ක්‍රමයෙන් තවතවත් ළංවිය. නොයෙක් දේ කතා කළෙමු. දැන් දැන් මාතෘකාද වැඩිවෙමින් පවතී. තුරු සෙවනේ කඳුබෑවුම ඉහළට පා නගන අතර, ගුණේ, ස්වර්ණා හා ටිකිරි තරමක් දුරින් හෙමින් හෙමින් පියනැගුහ. කීපවරක්ම ඇය, ඔවුන්ට අඬගැසූ නමුත් ඒ බොරුවට බව මට සිතුනි. ඔවුන්ද අප අසලට ළං නොවූයේ ඕනෑකමින්ම අප දෙදෙන තනි කිරීමට බව මට කීපවරක්ම සිතුනි. සෑහෙන දුරක් පයින් ගමන්කර ලෝකාන්ත තැනිතලාවට අපි ළඟාවීමු.

ලා හිරුරැස් බැසයන සිසිල් පරිසරය තුල පහලින් පෙනෙන පාතාලය අපි නැරඹීමු. මීදුම සහ වලාකුළු අතරින් පහළින් පෙනෙන බලංගොඩ ප්‍රදේශයේ මහා මාර්ග, පෙනුනේ ගුවන් යානාවක සිට බලනවිට පහළින් පෙනෙන දර්ශණයක් ලෙසිනි. කෙතරම් චමත්කාර දර්ශණයක් වුවද, පාතාලය අසලට යාමට ඇය බිය වූයෙන් මගේ අතින් අල්ලාගෙන ඒ දර්ශණය නැරඹුවාය. මාද, ඇගේ අත හොඳින් අල්ලාගෙන වැඩිපුර අයිනට නොගොසින් සිටි අතර ජීවිතයේ මුල්වරට ගැහැණු ළමයෙකු අතින් අල්ලාගෙන සිටීම පිළිබඳව මට මා ගැනම පුදුම සිතුනි. මේ නම් අහම්බෙන් සිදුවූවක් නොව පෙරසිට පතාගෙන ඒමක් යයි සිතුනි. අප හඳුනාගෙන පැය කීපයකින් මෙතරම් ළංවීම කොතරම් පුදුමද, මගේ අනෙක් මිතුරන්ට නම් එය විශ්වාස කරන්නත් බැරි වේවි. මේ ආදී නොයෙක් සිතුවිලි මැද අනෙක් මිතුරු මිතුරියන්ද සමග ආපසු ගමන් ඇරඹූයේ හිරුබැසගිය පසුවය.

## <u>ලිස්සා යාම</u>

බොහෝ අවස්ථාවල අනිත් මිතුරු මිතුරියන් ජේනතෙක්මානයේවත් නැති බව දැනුනි. එක් අවස්ථාවක "අනේ විජේ මට නම් බයයි වටේටම කැලේ, කළුවරත් වැටීගෙන එනව, ජේනතෙක්මානෙ කවුරුවත් නෑ" යයි කීවාය. "බය වෙන්න එපා කුසුම් අපි ඉක්මන් කරල යමු, අනිත් අය වැඩි ඈතක් නෑ" ...."අනේ මට මහන්සියි කලන්තෙ වගේ" යයි කියත්ම ඇය ලිස්සා වැටෙන්නට ගිය නමුත් මම වහාම වැටෙන්න නොදී අල්ලාගතිමි. නමුත් මටත් තරමක බියක් ඇතිවිය. වතුර ඩිංගක්වත් හොයාගන්න තැනක් නැහැ. ඇය හොඳටම ක්ලාන්ත වුනොත් නම් හරහට වඩාගෙන යාම හැර වෙන කළයුතු දෙයක් නැතිබව මට හැඟුනි. නමුත් එවැන්නක් සිදු නොවූයෙන් "කිසි දේකට බයවෙන්න එපා පුළුවන් විධියට හෙමින් හෙමින් යමු." යයි කියා ඈ සනසමින් හෙමින් හෙමින් පියනැගුවෙමු. (මෙම කැලෑවෙහි දිවියන්ද සිටින

බව එකල අප දැන සිටියේ නැත.) එදින අටවක දිනක් වූ අතර හොඳින් අඩසඳ පායා තිබුනි. අප බස්රිය වෙත ළඟාවූයේ රාත්‍රී 9.30 ට පමණය. බස්රිය පිටත්වූ පසු, විඩාපත් ඇය, මගේ උකුල මත නින්දට වැටුනි. මා කල්පනා සාගරයේ ගිලුනි. ගතවූ පැය කීපය සිහිනයක්දැයි වරෙක සිතුනි. ආදරය, බිය-සන්ත්‍රාසය දනවන, ජීවිතයේ කිසිදාක නොලද නව අත්දැකීමකි. ඔබව මට මුනගැසුනේ අදමද?, හැම මොහොතකම මට හැඟීගියේ කාලයක සිට අප ඇසුරු කරමින් සිටි ලෙසටය. නැවත කවදාවත් අප වෙන් නොවන බව මගේ ස්ථිර අදිශ්ඨානය වී හමාරය. පසුදා අළුයම බස්රිය සරසවි භූමියට ආවිටය, මා පියවි ලොවට ආවේ. ඇය ඒ වනවිටත් තද නින්දේ පසුවිය. එසේ අවසන් වූ ලෝකාන්ත චාරිකාව නව ආදර කතාවක ආරම්භය විය.

එදිනම හැන්දෑවේ මා සංඝමිත්තා ශාලාවට ගොස් ඇ හමුවිය. එහි අමුත්තන්ගේ ශාලාවට වී අප, අප ගැනම නොයෙක් දේ කතා කරමින් පැය දෙකක් පමණ ගත කළෙමු. දින කීපයකට පසු ශාලාවෙන් පිටතට පැමිණි අප, දිනපතාම වාගේ සවස 5 සිට 7 පමණ වනතුරු කලාගාරය අවටත්, එහි සිට හිඳගල දක්වාත්, පියනගන අතර අළුත් ''කරත්තය'' (නව යුවලක් හැඳින්වීම සඳහා සරසවි සිසුන් අතර පැවති වචනයක්) හමුවන හිතමිතුරන්ගේ සුභපැතුම් වලට නිතර ලක්විය. දිනක් (W.U.S.) කැන්ටිමේදී, හිතමිතුරන්ට තේපැන් සංග්‍රහයක්ද දුනිමු. වසර දෙකක්ම සරසවියේ ගතකළත්, නුහුරු තහනම් පරිසරයක්වූ, මහවැලි ගඟ අසබඩ ''ලවර්ස් ලේන්'' සහ ''හිල්ඩා පාක්'' පරිසරයට ඇතුළුවීමට අපිද වරම් ලදිමු.

වැඩිකල් නොගොස් තවත් හිතමිතුරු අළුත් කරත්ත දෙකක් පාරට දමා තිබුනි. ඒ මගේ රූමා (room-mate) වන වීරසේකර සහ කුසුම්ගෙ රූමා වන සුනිලාත්, ජයවීර සහ අමිතා යුවලත්ය. සමහර දිනවල අප හයදෙනාම ජේම්ස් පීරිස් ශාලාව පිටුපස කඳුමුදුන පැත්තේ සැරිසරන්නට වීමු.

## සමුගැනීම

දින ගණන් සති ගණන් කල් ගෙවමින් පළමු වාරයේ අවසන් දිනයද (1967-12-14) උදාවිය. මෙතෙක් කල් මා දුම්රියෙන් ගමන් කළද, ඇ සමග තව පැය කීපයක් ගතකළහැකි බැවින් බස්රියෙන් යාමට සූදානම් වූයෙමි. කෑගල්ල දක්වා  ඇ සමග ඉතා සතුටින් පැමිණි නමුත් එහිදී අපට වෙන්වීමට සිදුවිය. ඇ වරකපොල බස්රිය වෙත පිය නැගූ අතර, මම කොළඹ බසයට ගොඩවුනෙමි. ජීවිත කාලය තුලම ඒ දක්වා මා මුහුණදුන් දුක්බරම මොහොත එයබව කීම අතිශයෝක්තියක් නොවේ. බස්රිය ගමන් අරඹා සැහෙන වේලාවක් යනතුරුම දෑසින් උනන කඳුළු නවතාගැණීම අපහසු විය. ගෙදර පැමිණි පසු නංගීට සහ පුංචිඅක්කට පමණක් අපේ ආදර කතාව හෙලිකළෙමි. නිවාඩු කාලයේදී අප හමු වූයේ ලිපි වලින් සහ සිහිනෙන් පමණි.

## දීර්ඝ-කෙටි නිවාඩුවට පසු

මාස ගණනක් දිග, සති තුනක නිවාඩුවෙන් පසු අපේම ලොවට පා නගන දිනය (68-01-07) උදාවිය. ආහාර-පාන පවා අමතක කර පැය ගණන් සතුටු සාමීචි, ආදර බස් දොඩමින් කාලය ගතකලෙමු. බොහෝ දිනවල සන්ධ්‍යා කාලය ගතකළේ පුස්ථකාලයටවී පාඩම් කරමිනි. ප්‍රථම වරට නැරඹූ චිත්‍රපටිය ''සිතගියතැන'' (67-12-07) වූ අතර හින්දි චිත්‍රපටියක් වූ ''ආයිමිලන්කීබේලා'' (68-01-15) සහ මහාචාර්ය්‍ය සරත්චන්ද්‍රයන්ගේ ''මහාසාර'' නාට්‍යයද (68-02-04) අපි සතුටින් නැරඹීමු. දළදා සමිඳුන් වැඳපුදා ගැන්මද, ගැටඹේ පන්සලේ මල්පූජා කිරීමද, වෙසක්සිරි නැරඹීමද, අමතක නොකළෙමු.

## නොහැදිනීම

අවසන් වසරේ තුන්වැනි වාරයේදී විජේවර්ධන ශාලාවේ පැවති වාර්ෂික සාදයට (social) ඇයට සහ ඇගේ යෙහෙළියන් කීපදෙනෙකුටම ආරාධනා කළෙමි. මුළදී ඊට අකමැති වූවත් පසුව එය පිළිගත්තාය.

එදින අමතක නොවන සිදුවීමක් වූබව ඇය තවමත් නොදන්නවා වියහැකිය. මම විජේවර්ධන ශාලාව ඉදිරිපිට, ඈ එනතෙක් බලා සිටියෙමි. (1968-06-24) ලස්සන සාරි හැඳ පැළඳගත් තරුණියන් දෙතුන්දෙනෙක් මා සිටි දෙසට එන බවත් ඉන් එක්කෙනෙක් ඇගේ හැඩරුවට ටිකක් සමාන බවත් පෙනුනි. නමුත් ඉතා අලංකාර ලෙස සැරසී සිටි බැවින් ඒ ඇය බව හඳුනාගැනීම අපහසුවිය. ස්ථිරවම හඳුනාගත්තේ ඇය කථාකළ පසුවය. මට මා ගැනම ලැජ්ජා සිතුන නමුත් ඒබව නොහඟවා සිටියෙමි.

## සරසවියට ආයුබෝවන්

අවසන් විභාගය ළං වත්ම අපගේ හමුවීම සතියකට දින දෙකතුනක් වූ අතර එයද පුස්ථකාලයට සීමාවිය. අන්තිමේදී විභාගයද අවසන්වී සරසවි දිවියට ආයුබෝවන් කියන, කඳුලින් පිරි දිනය (1968-08-13) උදාවිය. ඉන්පසු අපි තැපැල් දෙපාර්තමේන්තුවට ණය ගෙවමින් කල්ගතකළද, මාස කීපයකට පසු දිනයක සරසවියට ගොස් හමුවීමට තීරණය කළෙමු.

## දත් පිරවීම

ඒ අනුව ඇය දත් පිරවීම සඳහා පියාගෙන් අවසර ගෙන පේරාදෙණි යාමට සූදානම් වූ අතර, මමද යම් අවශ්‍යතාවයක් සඳහා පේරාදෙණි යායුතුබව මගේ දෙමවුපියන්ටද පැවසුවෙමි. නමුත් මා යන්නේ කුසුම් හමුවීමට බව නංගීට පමණක් කීවෙමි. එදින (68-10-21) අළුයම අවදිවී මා පිටත්වූ අතර, මාහේනේදී මා ගිය බස්රියටම ඇය ගොඩවිය. ඉතා දුර්ලභ සිද්ධියක් බැවින් අප දෙදෙනාටම ඇතිවූයේ කිවනොහැකි තරම් ප්‍රීතියකි. මහනුවරදී දිවා ආහාරය ගෙන සුපුරුදු පරිසරයට පියනැගූ අප, කලෙකින් හමුවූ පරෙවි ජෝඩුවක්සේ අක්බාර් පාලම අසල මහවැලි ගංඉවුරේ අඳුර වැටෙනතුරුම තුරුළුවී සිටියෙමු. ඇය රාමනාදන් ශාලාවේ යෙහෙලියන් සමග රාත්‍රිය ගතකළ අතර, මම සුපුරුදු ලෙස විජේවර්ධන ශාලාවේ ගතකළෙමි.

පසුදින උදේ දන්තවිද්‍යාලයට ගිය නමුත් දත් පිරවීමට නියමිත වේලාවක් ලැබුනේ ඊටත් පසුවදාය. එබැවින් මෙදිනද පෙරදින මෙන්ම ගෙවීගිය අතර, හැමදාම ලැබෙන තෑගිවලට අමතරව ලේන්සු තුනක්ද ලැබිනා. කුඩාවූවත් එය මට වටිනා තෑග්ගක්විය. එය වඩාත්ම අවශ්‍ය වූයේ කඳුළු සලනවිටය. අප කොතරම් සතුටින් සිටියත්, බොහෝ අවස්ථාවල මතුවන මතභේද කෙළවර වූයේ කඳුලිනි. නමුත් ඉන් වඩාත්ම පිළිබිඹු වූයේ වැඩි සෙනෙහසයි, ආදරයයි. කොතරම් කඳුළු සැලුවත් සැමවිටම අප වෙන්වගියේ සතුටිනි. පසුදින උදෑසනින්ම අප දන්තවිද්‍යාලයට ගිය අතර ඇගේ දත් දෙකක් පුරවා එක දතක් ගලවා තිබුනි. සවස්වනතුරු නොසිට, නිවෙස් කරා පිටත්වූ අපි මාහේනේදී ටිකකලකට වෙන් වීමු.

## හමුදා-සිසු ගැටුම

මාස කීපයකට පසු නැවත දිනක පේරාදෙණි යාමට අපි තීරණය කළෙමු. නියමිත දිනට පෙරදින (69-02-02) මා පිටත්වූයේ විජේවර්ධන ශාලාවේ නතරවී, පසුදින ඈ හමුවීම පිණිසය. බස්රියෙන් ගිය මා පේරාදෙණිය මල්වත්ත අසලින් බැස, විජේවර්ධන ශාලාව වෙත පියනැගුවෙමි. එය පහසුවෙන්ම පයින් යාහැකි දුරක් වුවද, මම ගලහ හන්දියේ බස්නැවතුම්පොලේ නතරවූයේ ඇයිද යනු මට තවමත් ප්‍රෙහේලිකාවකි. එහි තවත් මැදිවියේ කාන්තාවක් පමණක් සිටියාය. ඇය මා දෙස කීපවරක්ම ඉතා ඕනැකමින් බලනබව දුටු මා ඈ දෙස බැලූවිටම, "මහත්තය කොහාට යන්නද ඉන්නෙ? "....යයි විමසා මගෙන් පිළිතුරු ලැබීමටත් පෙර, "ඇයි දන්නෙ නැද්ද මෙහෙ කලබල ගැන, මෙතන ඉන්න එක බොහොම අවදානම්. ඉක්මනට මෙතනින් යන්න. පාර දිගේ යන්න එහෙම එපා..... " යනුවෙන් මට උපදෙස් දුනි. "මම මේ කොළඹ ඉඳල එන ගමන්" කියා වහාම බැංකුව පිටුපස පාරදිගේ දුම්රියපොළ (සරසවි උයන) පැත්තෙන් විජේවර්ධන ශාලාවේ පිටුපස පැත්තෙන් ගියෙමි. තත්වයේ බරපතලකම වැටහුනේ එවිටය. හමුදා - සිසු ගැටුමක් හේතුකොටගෙන සරසවිය වහාම වසා දමා ඇති අතර, සරසවි

භූමියේ සිට හමුදා භටයින් රැගත් ට්‍රක්රථ ගණනාවක්ම පිටත්ව යනු දුටුවෙමි. ඔවුන් එසේ පිටත් වූයේ නිකන්ම නොව සිසු නේවාසිකාගාර වෙත ගල්-මුල් ප්‍රහාර එල්ල කරමිනි. මා වහාම සරසවිඋයන දුම්රියපොළට ගොස්, මාතලේ වීරසේකරගේ ගෙදරට යාම සඳහා පිටත් වූයෙමි. **"බස් නැවතුම්පොලේ සිටි කාන්තාව හමු නොවුනා නම් තවත් සරසවි සිසුවෙකුගේ අවසානය එයවනු නියතයි!! "**

මගේ ආරක්ෂාව පිණිස එළවළු මල්ලක්ද රැගත් මම මාතලේ දුම්රිය පැමිණෙනතුරු  මහනුවර දුම්රියපොලේ නතරවී සිටියෙමි.  හමුදා භටයින් විශාල පිරිසක් දුම්රියපොළට ඇතුල්වෙන බව දුටු මම තවත් ආරක්ෂක පියවරක් ගතිමි. වේදිකාවේ කෙළවරක එකම පවුලක අය වැනි කීපදෙනෙක් වාඩිවී සිටි බංකුවක කොනක මමත් වාඩිවී ඔවුන් සමග කතාවට වැටුනි. ඒ සමගම මගේ වයසේ පිරිමි ළමයෙක් පිටුපස එලවමින් හමුදා භටයින් කීපදෙනෙක් දුවන්නටවිය. (කිසිම අවස්ථාවක, නාඳුනන අය  සමග අතරමගදී කතාකිරීමේ පුරුද්දක් මට නැත. නමුත් අවස්ථාවෙ හැටියට කළයුතු හොඳම දෙය එය විය. )

## බස්රියේ නවාතැන

රාත්‍රී දහයට පමණ වීරසේකරගේ නිවසට ගිය නමුත් ඔහු නිවසේ නොසිටි බැවින් හමු නොවිය. මා ඔහුගේ රූම්මේට් බවත්, කොළඹ සිට පැමිණි බවත්, තාත්ත නම් මාව හඳුනන බවත් කීවිට, ඔහුගේ මල්ලී, "පප්ප නිදි" යයි කීවේය. මා ගැන කිසිම තැකීමක් නොදක්වන බව පෙනුනෙන් සුළු නිහැඬියාවකින් පසු, "එහෙනම් මම යන්නම්" කියා සුන්වූ බලාපොරොත්තු සහිතව ආපසු බස් නැවතුම්පොළට පැමිණ එහි ගාල්කරතිබූ බස්රියක (22ශ්‍රී1504) පිටුපස අසුනට වී හන්සි වූයෙමි. ටික වේලාවකට පසු කොස්සක් හා වතුර බාල්දියක් රැගත් පුද්ගලයෙක් බස්රථ සෝදන්නට පටන්ගති. ඔහු සෝදන්නේ පිටපැත්ත පමණක් බව නිරීක්ෂණය කළ මා බසයේ ජනෙල් සියල්ල වසාදැමීමි. සුළු වේලාවකින් මා සිටි බසයට ගොඩවූ ඔහු ජනෙල් සියල්ල වසා ඇති බව දැක ආපසු ගොස් තම රාජකාරියේ නිරතවිය.

අළුටම 3.45 ට පිටත්වූ මාතර සීඝ්‍රගාමී බස්රියෙන් වරකපොලට ආවෙමි. පසුව මාහේනට පැමිණියේ කෙසේ හෝ ඇ හමුවී පේරාදෙණි නොයනලෙස දැන්වීමටය. නමුත් ඇය පියා සමග පැමිණසිටි බැවින් කිසිවක් කීමට නොහැකිවිය. ඇය වරකපොල බසයට නැගුන පසු, මමද ඊළඟ බසයෙන් වරකපොලට ගියනමුත් ඇ හමු නොවීය. වෙන කළහැකි දෙයක් නොවූයෙන් නැවත පේරාදෙණියට ගියෙමි. හිඳගල නවාතැන වෙත පියනගන ඇ මගදී හමුවිය. පසුව අපි උඩපේරාදෙණියේ යහළුවෙකුගේ (කේ.බී.හේරත් සහ චිත්‍රා) නිවසට ගොස් හවස ආපසු ගමන් ඇරඹීමු.

## විභාග ප්‍රථිඵල

සති කීපයකට පසු කලා අංශයේ ප්‍රථිඵල නිකුතුවන දිනය දැනගත් අපි ඊට පෙර දින (69-02-28) සරසවියේදී හමුවූයෙමු. සුපුරුදු පරිදි ඇය රාමනාදන් ශාලාවේත් මම විජේවර්ධන ශාලාවේත් නවාතැන්ගත් අතර ඇය උපාධිය සමත්වීමේ ප්‍රීතිය දින දෙකක්ම භුක්ති වින්දෙමු.

මා පළමු වසරේ විභාගයෙන්(GSQ)  තෙවැනිවරටත් රසායන විද්‍යාව සඳහා ඌන සාමාර්ථයක් ලත් බැවින් ඒ සඳහා නැවත දේශණ වලට සහභාගී වීමට සිදුවිය. අපි කීපදෙනෙක්ම ගෙළිඔය "තිලක නිවස" හි නවාතැන් ගතිමු. ජයවීර සහ වීරසේකරත්, අමිතා සහ සුනිලාත්, එහිම නවාතැන් ගෙන සිටියහ. මේ කාලයේ දෙතුන් වරක්ම කුසුම් පැමිණි අතර, ඒ සැමවිටකම ඇයට අමිතා සහ සුනිලාගේ කාමරයේ නවාතැන් පහසුකම් සලසාදෙන ලදී.

## තැපැල් පත්

කීපවිටකම මා යැවූ ලිපි නැතිවූබව ඇ පැමිණිළිකළ බැවින් වරින් වර ඇයට යැව්වේ තැපැල්පත්ය. නමුත් ඒ සාමාන්‍ය තැපැල්පත් නොව අඩුවශයෙන් පිටු හතරකින්වත් සමන්විත ඒවාය. ඒ කිසිවක් නැති නොවීය. තවත් සමහර අවස්ථාවල සිංහල "මෝස් සංඥා" ක්‍රමයද භාවිත කළෙමු.

## දෙමව්පියන් හමුවීම

අප ගැන කවුදෝ කේලමක් කියා ඇති බැවින්, පියා විසින් ඇයට දොස් පැවරූ බව මට දන්වා එවූ අතර පියාට ලිපියක් ලියන ලෙසද දන්වා තිබුනෙන් ඇගේ පියාට ලිපියක් යැව්වෙමි.

පසු දිනක (69-06-18) ප්‍රථමවරට ඇගේ නිවසට ගිය මා, ඇගේ පියා, පුංචිඅම්මා සහ කිරි අත්තා විසින් පිළිගත් අතර අපගේ විවාහය පිළිබඳ යම් යම් දේ සාකච්ඡා කළෙමු. අඳුරුවැටීගෙන එනවිට රාත්‍රී ආහාරයද භුක්ති විඳ ආපසු ගෙදර ආවෙමි. වරක් රෝගාතුරවී කෑගල්ල රෝහලේ සිටි ඇය බැලීමට දෙවරක් එහි ගියෙමි.

ඉන්පසු අප පේරාදෙණි ගියේ කලාතුරකිනි. මසකට වරක් පමණ ඇගේ නිවසට යාම පුරුද්දක්විය. නමුත් කිසිවිටකත් රාත්‍රිය එහි ගතකළේ නැත. වරින්වර සාරි කීපයක් තෑගි කළ නමුත් ඒ සෑමවිටම කුමක් හෝ අඩුපාඩුවක් ඇගෙන් කියවුනි. ඒ සෑමවිටකම මගේ සිත පෑරුන අතර පළමු වරට සිත් තැවුලට පත් වූ දිනයේ, "මින් පසු කිසිම දිනක කිසිම තෑග්ගක් නොදෙන බවට සිතා ගතිමි". එපමණක් නොව එදින දුන්නේ ඉතා වටිනා සාරියකි, ඒ ඉතාමත්ම රෙදි හිඟ කාලයකි. එය දෙනවිට ඇගේ පියාද එහි සිටියේය. ඔහු එහි නොසිටියේ නම් එම සාරිය ආපසු ගෙන වත්ත පහළ ඇලට විසිකිරීමට සිතුනි. නමුත් පසුව එය සාමාන්‍ය දෙයක් විය. එක් වරක් පමණක් (70-05-18) කිසිම අඩුපාඩුවක් නොකියා සතුටින් භාරගත්තාය.

## බුලත් හපේ

දිනක් (71-01-14) මා ස්කූටරයෙන් (ලැම්බ්‍රෙටා 5ශ්‍රී8684) ඇගේ නිවසට ගොස් එන අතර අඹේපුස්ස හන්දිය අසලදී ඉදිරියෙන් පැමිණි බස්රියක සිටි මගියෙකුගේ බුලත්කෙළ පහරක් මුහුනේ සිට දෙපා දක්වාම වැදුනි. වහාම අයින්කර නවතා, ස්කූටරයේ කුණු ධූවිලි පිසදමන රෙදි කැබැල්ලෙන් මූන පිසදමනවිට, බුලත්විටක් හපමින් එන කෙනෙක් මාව දැක, ඔළුවෙ අතගසාගෙන "අම්මප මහත්තයෝ මොකදවුනේ" යයි කීවේය. වෙච්ච දේ කෙටියෙන් පවසා වතුර ඇති තැනක් ගැන ඔහුගෙන් විමසූවිට, පහළ ඇති දොලපාර පෙන්වන ලදී. වහාම එහි ගොස් මුහුණ අතපය සෝදාගෙන කෙලින්ම ගෙදර ආවෙමි.

## මුල්ම සැකය

දිනක් ඇගෙන් ලැබුන ලිපියක, වෙනත් කෙල්ලෙක් සමග මගේ සම්බන්ධයක් ඇති බව ආරංචිවී හිතේ අමාරුවෙන් සිටින බව සඳහන් විය. මා ගැන එවැනි සැකයක් ඇතිකරගනී යයි සිහිනෙකින්වත් නොසිතූ මා බලවත් සේ කනගාටු වූ අතර, එදිනම පිළිතුරක් යැවීමි. නමුත් ඈ හමුවනතෙක් ඉවසිල්ලක් නොවූයෙන් පසුවදාම (71-07-29) ඇගේ නිවසට ගියෙමි. ඒ දිනවල මාතලේ ජයසූරිය අපේ ගෙදර නැවතී සිටි බැවින් එහි ගියේ ඔහුත් සමග ස්කූටරයෙනි. නමුත් මගේ සිතේ ඇතිවූ කලකිරීම පහසුවෙන් ඉවත් කළ නොහැකිවිය. විවාහවූ පසුත් මෙවැනි තත්වයක් උද්ගත වුවහොත් මගේ අනාගතය මුළුමනින්ම අඳුරුවියහැකිය යන බිය හා සැකය මගේ සිතේ හොල්මන් කරන්නටවිය. වඩාත්ම ඥානාන්විත තීරණය වනුයේ ඇගෙන් වෙන්වීම වුවද, ඇය හා විවාහවන බවට ස්ථිර පොරොන්දුවක් ඇය වෙත ලබාදී තිබූ අතර, පොරොන්දු කඩකිරීම මගේ ප්‍රතිපත්ති වලට විරුද්ධ බැවින්, සිදුවන ඕනම දේකට මුහුණදෙන බවට අදිටන් කරගතිමි.

## කේන්ද්‍ර නොගැලපීම

අපගේ විවාහයට සුදුසු නැකතක් බැලීම සඳහා කොලොන්නාවේ පදිංචි කේන්ද්‍ර පලාපල සහ නැකැත් සෑදීම සඳහා ප්‍රසිද්ධියක් උසුලන භික්ෂූන් වහන්සේ නමක්වෙත ගියෙමි. බුලත්හුරුල්ලක් මත තැබූ කේන්ද්‍ර පිටපත් දෙක උන්වහන්සේගේ අතට දුනිමි. මිනිත්තු කීපයක් හොඳින් පරීක්ෂාකර බලා "කාගෙද මේ" යයි විමසූවිට, "පිරිමි කේන්දරය මගෙ" යයි කීවෙමි. "මේකනම් කරගන්න එපා. මේක ගැලපෙන්නෙ නැහැ. ඕවට නැකැත් හදල මමත් අපාගතවෙයි. " යනුවෙන් පවසන ලදී. හොඳ වෙලාවක්

නැත්නම් වැඩිපුර නරකක් නොවන වෙලාවක් නැතිවෙයිද යනුවෙන් මා කීවිට "නොගැලපෙන ඒවට නැකැත් හදන්න මං ඉගෙනගෙන නෑ මහත්තයො ඔන්න ඕක අරන් යන්න" කියා බුලත්හුරුල්ලයි කේන්ද්‍ර දෙකයි මා වෙතට වීසි කළේය.

## සවිමත් බැම්ම

ඇගේ පියා සහ පුංචිතාත්තා චාරිත්‍රානුකූලව අප නිවසට පැමිණි (71-09-12) අතර මගේ දෙමව්පියන් විසින් සතුටින් පිළිගත්හ. විවාහය සඳහා සුදුසු කාලසීමාවක් පිළිබඳව සාකච්ඡාකර තීරණයකට එළඹුන අතර, පසුව කේන්ද්‍ර වලට අනුව නැකැත් පිළියෙල කරන ලද්දේද, ඔවුන්මය.

එසේ පිළියෙල කරගත් නැකැත් වලට අනුව 1971 ඔක්තෝබර් 8 වැනි සිකුරාදා කෑගල්ල කච්චේරියේදී අපගේ විවාහය ලියාපදිංචි කරනලදී. එය ඉතා චාම් ලෙස සිදුවුවත් අපට එය ප්‍රීතිජනක දිනයක් විය. නීතියෙන් එක්වූවත් චාරිත්‍රානුකූලව එක්වීමට තව කල් ඇති නිසා තාවකාලිකව වෙන්වූ අපි නිවෙස් බලා පිටත් වූයෙමු. ඉන්පසු මංගල ඇඳුම් ආභරන ආදිය පිළියෙල කිරීම සඳහා ඈ කොළඹ පැමිණි, කීප දිනකම අප හමුවිය. එකල වටිනා සාරි හිඟ කාලයක් වූ බැවින් මනිපූරි සාරි ගත්තේ ජාතික ලොතරැයි මණ්ඩලයෙනි. ඒ සඳහා විවාහ සහතිකය ඉදිරිපත්කර ශත පනහේ ස්වීප් ටිකට් සියයක් මිළට ගතයුතු විය.

නොදැනීම කාලය ගෙවී ගොස් මෙතෙක් පුලපුලා සිටි දිනය උදාවිය. ඒ 1971 නොවැම්බර් 24 වැනි බුද දිනයයි. අපගේ විවාහ මංගලෝත්සවය මෙදින කෑගල්ල සල්ගාදු හොටලයේදී සිදුවිය. පෝරුවේ චාරිත්‍ර පෙරවරු 11.15 ට පමණ සිදුකෙරුන අතර දිවා භෝජනයෙන් පසු මංගල ඡායාරූපයට පෙනී සිට, සියළු නෑ හිතවතුන්ගෙන් සමුගෙන අපේම ලොවකට පියනැගුවෙමු. සිවුදිනකට පසු නොවැම්බර් 28 වැනිදින හිඹුටානට පැමිණ, අප නිවසේ වූ චාම් උත්සවයකට සහභාගිවී, මංගල උත්සව නිමා කර, නව යුග දිවිය ආරම්භ කළෙමු.

ගෙවීගිය ඉම්හිරි අතීතයේ සිවුවසරක පමණ කාලයතුල බොහෝ අවස්ථාවල අප සිටියේ සිහින ලොවක බව පැහැදිලි වූයේ විවායයෙන් කෙටි කලකට පසුවය. එතෙක් මෙතෙක් විසිවසරක් තිස්සේ ගල්පරවල ගැටෙමින් චන්ඩමාරුත අතරින් පැදවූ යුගදිවි යාත්‍රාව තව තවත් ශක්තිමත් වෙමින් සාමකාමී නිසල සයුරකට පිවිසෙමින් පවතින අතර ජයග්‍රහනය කරා ළංවන බව මට හැඟී යයි.

1991 ඔක්තෝබර්7
හිඹුටානේ නිවසේදීය.